**ජනාධිපතිවරයාගේ අරමුදල - 2019**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

ජනාධිපතිවරයාගේ අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනත සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශ්ව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, ත්‍යාගලාභීන් නිශ්චය කරනු ලැබූ දින සිට මාස 06 ක් ඉකුත්වීමෙන් පසුව ප්‍රදානය නොකළ රාජසන්තක වූ මෝටර් රථ හා වෙනත් භාණ්ඩවලට අදාළ2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා එකතුව රු. 24,948,809 ක් හා 2019 වර්ෂයට අදාළව එකතුව රු. 16,033,489 ක් අරමුදල මෙතෙක් ගිණුම් ගත කර නොතිබුණි. | රාජසන්තක වූ මෝටර් රථ සහ වෙනත් භාණ්ඩවල මුදල් වටිනාකම ජනාධිපති අරමුදලට සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මුදල් කර ප්‍රේෂණය කිරීමක් සිදු නොකෙරේ. රාජසන්තක මෝටර් රථ භාණ්ඩ වෙනත් ප්‍රවර්ධන දිනුම්වලට යොදා ගන්නා බව සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලිඛිතව දන්වා ඇත. | අදාල පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළයුතුය. |
| (ආ) | 2018 වර්ෂයේදී ආයෝජනය කළ රු.1,400,000,000 ක ස්ථාවර තැන්පතු 2019 වර්ෂයතුළකල් පිරීමේදී රු. 138,320,000 ක දළ පොලී ආදායමක් උපයා ගෙන තිබුණද, සමාලෝචිතවර්ෂය තුල පොලී ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණේ රු. 130,575,027 ක් පමණි. ඒ අනුව රු.7,744,973 ක් පොලී ආදායම් අඩුවෙන් දක්වා තිබුණි. | රු.1,400,000,000 අදාල ආයෝජනය සඳහා බැංකුව විසින් රු. 7,744,973 ක රඳවා ගැනීමේ බදු අයකිරීමෙන් පසුව රු.165,155,027 ක් පොලී මුදල් ලෙස ශුද්ධ අගය යොදා ගෙන ඇති අතර, මූල්‍ය ප්‍රකාශනවල අවසාන ප්‍රතිඵලයට මෙහි බලපෑමක් සිදුවී නැත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම් ඇතුලත් කළ යුතුය. |
| (ඇ) | ණයහිමි හා ගෙවිය යුතු ගිණුම් වෙනුවෙන් නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ | පසු ගිය වර්ෂවල ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් ලෙස සලකා සමුච්චිත අරමුදලට | නිවැරදි තොරතුරු ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| රු.3,626,727 ක් වටිනා මාස 06 ඉක්ම වූ චෙක්පත් ප්‍රවර්ථන වර්ෂයේ ආදායමක් ලෙස නොසලකා සමුච්චිත අරමුදලට සෘජුවම බැර කිරීම නිසා ප්‍රවර්ථන වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ගැලපීම් කර ඇත. | |

( ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| (i) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ප්‍රවර්ථන වර්ෂයේ අතිරික්තයට ගැලපීම් නොකළ යුතු පෙර වර්ෂයේ අතිරික්තයේ වෙනස්වීම් රු.6,522,113 ක් ගලපා තිබුණි. | ගිණුම්කරණ ප්‍රමිති යටතේ හෙළිදරව් කළ යුතු ආකෘතිය යටතේ ගැලපීම් ඇතුළත් කර ඇත. | නිවැරදි තොරතුරු ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ii) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතට ගැලපීම් නොකළ යුතු එකතුව රු.3,841,385 ක විචලනයන් ගැලපීම් කර තිබුණු අතර කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතට ගැලපිය යුතු එකතුව රු.322,000ක් වූ විචලනයන් ගලපා නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ උපචිත ශේෂ සටහන් නොවීමේ දෝෂය 2020 වර්ෂයේ සිට නිවැරදි කර ඇත. | නිවැරදි තොරතුරු ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 7 දරන ජනාධිපතිවර යාගේ අරමුදල් පනතේ 6 වන වගන්තිය | අරමුදලට අයත් මුදල්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට යොදවනු ලැබිය හැකි වුවද, 2019 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා දරා තිබූ එකතුව රු. 659,287,255 ක් සඳහා විගණිත දිනය වූ 2021 අගෝස්තු 02 වන දින දක්වාත් මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත | පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් | ඉන්දියාවේ නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ පවත්වාගෙන යන රු. 6,000,000 ක අග්‍රිමයෙන් සිදුකරනු ලබන වෛද්‍යාධාර ගෙවීම් | ජනාධිපති අරමුදල මගින් පවත්වාගෙන යන රු. මිලියන 6 ක අග්‍රිමය ප්‍රමාණවත් නොවන අවස්ථාවල වෛද්‍යාධාර ගෙවීම සඳහා චෙක්පත් වෙනම නිකුත් | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| රෙගුලාසි 372 | අග්‍රිමයෙන් සිදුකරනු ලබන ගෙවීම් ලෙස නොසලකා ඍජුවම මුදල් පොතෙන් සිදුකරනු ලබන ගෙවීම් ලෙස සලකා මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි .මේ හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව එම අග්‍රිම ශේෂයරු.6,000,000 වුවත් ඉන්දියාවේ නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය මඟින් තහවුරු කළ එම ශේෂය රු. 13,909,814.17 ක් පමණක් විය. | කරනු ලැබේ. ඒ අනුව අවස්ථා දෙකකදී නිකුත් කළ රු.මිලියන 8 ක මුදල ශේෂය තුල අඩංගු වන නමුත් වර්ෂ අවසානයේදී නිකුත් කිරීම හේතුවෙන් දෙසැම්බර් 31 දින වනවිට මෙම චෙක්පත් මගින් ගෙවීමට බිල්පත් ඉදිරිපත් නොවීම නිසා අග්‍රිමයේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩිවී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.615,388,704 ක අතිරික්තයක් වූ අතර, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.254,920,004 ක අතිරික්තයක් විය. ඒ අනුව මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.360,468,700ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී පසුගිය වර්ෂයට සාපේක්ෂව ආදායමේ වැඩිවීම රු. 530,607,859 ක් හෙවත් සියයට 22 ක් වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබූ අතර, පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම්වලද වැඩිවීම රු.169,860,392 ක වර්ධනයක් විය.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබීම් සහ පොළී ආදායම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් රු . මිලියන 481.19 කින් හා රු .මිලියන 27.26 කින් එනම් සියයට 22 කින් හා සියයට 13කින් වර්ධනය වී තිබූ අතර, වෙනත් පාර්ශ්වයන්ගෙන් දායකයන් ලැබීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 22.16 කින් වැඩි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් වෛද්‍යාධාර ,සුභසාධන කටයුතු,සංස්කෘතික කටයුතු,ආගමික කටයුතු,අධ්‍යාපනික කටයුතු ,ක්‍රීඩා හා කලා කටයුතු,විශේෂ ව්‍යාපෘති සහ දේශීය ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා එකතුව රු.මිලියන 1,189.70 ක් වැය කර තිබුණි.එම වටිනාකම මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස සැලකූ විට සියයට 51 ක් විය.

(ඇ) සුභසාධන කටයුතු , ක්‍රීඩා හා කලා කටයුතු, විශේෂ ව්‍යාපෘති හා දේශීය ශිෂ්‍යත්ව ප්‍රදානය වෙනුවෙන් දරන ලද වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට87කින් ,සියයට 2700 කින් හා සියයට 71 කින් වර්ධනය වී තිබුණු අතර,වෛද්‍යාධාර හා ආගමික කටයුතු ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 14 කින් හා සියයට 41 කින් අඩු වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2,348 ක මුදලක් ආයෝජනය කර තිබූ අතර රු. මිලියන 1,745 ක ආයෝජන ආපසු ලබාගෙන තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආයෝජන වටිනාකමෙහි රු. මිලියන 603 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | එක් එක් රෝග සඳහා ගෙවීම් කිරීමේදී එම රෝග සඳහා අරමුදලේ පාලක මණ්ඩලය විසින් අනුමත කර තිබූ සීමාවන් ඉක්මවා රෝගීන් 136 දෙනෙකුට එකතුව රු.57,899,147 ක් ගෙවා තිබුණි. මෙම රෝග සඳහා ගෙවීමේ සීමා ඉක්මවීම අනුමත සීමාව හා සසඳන විට සියයට 243 ක් පමණ විය. | අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අනුමැතිය යටතේ ගෙවීම් සිදුකර ඇත. | සමාන අවස්ථා ලැබෙන ක්‍රමවේදයක් සකස් කිරීමේ හැකියාව සලකා බැලීම. |
| (ආ) | සමාලොචිත වර්ෂයේදී අරමුදල විසින් වෛද්‍යාධාර ගෙවීම සඳහා රු. මිලියන 1,019.31 ක් වැය කර තිබුණු අතර සුභසාධන, ආගමික , සංස්කෘතික, අධ්‍යාපනික, ක්‍රීඩා හා කලා සහ විශේෂ ව්‍යාපෘති සඳහා එකතුව රු.62,798,411 ක් අරමුදල විසින් ගෙවා තිබුණි.එසේම සමාලෝචිත වර්ෂය තුළ ශිෂ්‍යත්ව යොජනා ක්‍රමයක් සඳහා ද රු.107,580,000 ක් ගෙවා තිබුණු අතර එය පෙර වර්ෂයේ එම ශිෂ්‍යත්ව යොජනා ක්‍රමය සඳහා දරන ලද වියදම් හා සැලකීමේදී සියයට 71 ක වැඩි වීමකි. | ශිෂ්‍යාධාර සඳහා තෝරාගනු ලබන ශිෂ්‍යත්වලාභීන්ගේ ශිෂ්‍යාධාර මුදල් වාරික දෙකකින් ලබාදෙනු ලබන අතර 2018 වර්ෂයට අදාල ශිෂ්‍යත්වලාභීන්ගේ තොරතුරු සනාථ කර ගැනීමෙන් පසුව එම වාරික දෙකම 2017 වර්ෂයේදීම ගෙවා නිම කිරීම හේතුවෙන් 2018 වර්ෂය තුල ශිෂ්‍යත්ව ප්‍රධානය සඳහා දරන ලද වියදම අඩු අගයක් ගැනීම නිසා මෙම වෙනස පෙන්නුම් කෙරේ. | විධිමත් හා නිශ්චිත ගෙවීම් ක්‍රමවේදයක් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) | ඉහත කී සුභ සාධන කාර්යය සඳහා දරන ලද රු. 26,752,867 ක් වු වියදම් තුළ ඇතුලත් වී තිබුණේ විශේෂ අනුමැතියක් මත අවස්ථා 66 කදි සිදු කරන ලද කරුණාසහගත දීමනාවල එකතුවකි. | සඳහන් කර ඇති සුභසාධන කාර්යයන් වෙනුවෙන් කරනු ලැබූ ගෙවීම් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ජනාධිපති අරමුදලේ අරමුණු සහ කාර්යන්වලට අදාලව විශේෂ අනුමැතිය මත සිදුකර ඇත. | පනතේ සඳහන් අරමුණු කෙරෙහිද අවධානය යොමු කරමින් සමාන අවස්ථා ලැබෙන ක්‍රමවේදයන් සකස් කිරීමේ හැකියාව සලකා බැලීම. |
| (ඈ) | 2019 වර්ෂයේදී අරමුදලින් රු. 22,545,544 ක් විශේෂ ව්‍යාපෘති සඳහා දරා තිබුණු අතර ඒ තුළ ශ්‍රී ලංකා පිළිකා සංගමයේ,ගාල්ල ශාඛාව විසින් සහන සත්කාර සේවා මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත රු මිලියන 53 වෙනුවෙන් සිදු කළ රු.මිලියන 20 ක අත්තිකාරම් ගෙවීම් ද ඇතුළත් වී තිබුණු අතර ඉතිරි රු.2,545,544 ක මුදල ගිරාදුරු කෝට්ටේ සෞඛ්‍ය ප්‍රවර්ධන හා සමාජ සවිබලගැන්වීමේ කේන්ද්‍රය විවෘත කිරිම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා දරන ලද වියදමක් විය. | 1978 අංක 07 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතේ 6(ඉ) වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයාගේ හා මණ්ඩලයේ මතය අනුව, මහජනතාවගේ සුභසිද්ධිය හෝ යහපත පිණිස වූ වෙනත් යම් කාර්යයක් සඳහා අරමුදලේ මුදල් යොදාගත හැකිය. ඒ අනුව ජනාධිපති අරමුදල මගින් සාමාන්‍යයෙන් කරනු ලබන ගෙවීම් වන වෛද්‍යාධාර, සුභසාධන, ආගමික, සංස්කෘතික, අධ්‍යාපන, ක්‍රීඩා සහ | විශේෂ ව්‍යාපෘති සඳහා දරන ලද වියදම් පිළිබඳව ප්‍රමාණවත් පසු විපරම් සිදුකර උපරිම ඵල අත් කර ගැනීමට අවධානය යොමු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කලාකටයුතුවලට අයත් නොවන විශේෂ ව්‍යාපෘතියක් ලෙස අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අනුමැතිය යටතේ ගෙවීම් සිදුකර ඇත. | |
| (ඉ) | විගණන දිනය වූ 2021 පෙබරවාරි 12 දින දක්වා ලැබුණු මුළු වෛද්‍ය ඉල්ලීම් සංඛ්‍යාවෙන්, 6,784 ක් හෙවත් සියයට 31 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2020 වර්ෂයේ සිට පවත්නා කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් අවස්ථා කිහිපයකදීම කාර්යාලය වසා තැබීම සහ අවම කාර්ය මණ්ඩලයකින් කාර්යාලීය කටයුතු පවත්වා ගෙන යාමද මෙයට හේතුවී ඇත. මේ වනවිට ගෙවීම් කටයුතු කඩිනම් කිරීමට කටයුතු කර ඇත. | අසීරුතාවයට පත් ඉල්ලුම්කරුවන් සඳහා කඩිනමින් ප්‍රතිචාර දැක්වීමට උපරිම ප්‍රයත්න දැරිය යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක්ද/ පවත්නා නිරීක්ෂණයක්ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11(ආ) වගන්තිය ප්‍රකාරව ලොතරැයි පැවැත්වීමෙන්ලැබෙන මුදලින් ,අරමුදලේ වියදම් දැරීමෙන් පසු ඉතිරිය ලොතරැයි මණ්ඩලය විසින් ජනාධිපතිවරයාගේ අරමුදල වෙත ප්‍රේෂණය කල යුතු අතර එසේ මුදල් ප්‍රේෂණය කිරීමේදී දින 22 සිට දින 409 දක්වා කාල පරාසයක ප්‍රමාදයක් නිරීක්ෂණය විය . | නව නිරීක්ෂණයකි | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. | අවසාන ගිණුම් සකස් කිරීමෙන් පසුව ප්‍රේෂණය කරන මුදල තීරණය කරන බැවින් මෙම ප්‍රමාදය සිදුවී ඇත. | අරමුදල් ලබාගැනීම නිසියාකාරව කරගැනීමට අවධානය යොමු කළ යුතුය. |